# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2012
### 2015 මාර්තු - මැයි

### මානවශාස්ත්‍ර පීඨය

### ප්‍රාසංගික කලා - PART E2015

### ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය නර්තන සම්ප්‍රදා

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. කොහොඹායක්කංකාරී ශාන්තිකර්මයට අයත් "කොහොඹා හැල්ලේ" වස්තු විෂය, නාද මාලාව, තාලරූප පිළිබඳ සාකච්ඡාවක් කරන්න.

02. ඔබ කැමති උඩරට වන්නමක ආකෘතිය සහ අන්තර්ගතය එහි තාලරූප සමඟ දක්වන සබැඳියාව පැහැදිලි කරන්න.

03. **<u>එක්කෝ</u>**
කොහොඹායක්කංකාරියේ හත් පදය අරබයා පහත සඳහන් මාතෘකා යටතේ පිළිතුරු සපයන්න.
    - i අරමුණ
    - ii ලය ප්‍රභේද
    - iii අලංකාර නැටීම
    - iv රංග භාණ්ඩ

    **<u>නැත්නම්</u>**
    පහතරට නර්තන සම්ප්‍රදායට අයත් හත් පද පෙළපාලියෙහි අන්තර්ගත පද්‍ය සාහිත්‍යය පිළිබඳ විමසීමක් කරන්න.

04. පහත සඳහන් මාතෘකා අතුරින් **<u>හතරක්</u>** **<u>(04)</u>** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    1. සව්දම්
    2. තාලම්
    3. කවුත්තම්
    4. පෙරහැර නැටුම්
    5. පන්තේරු
    6. උඩැක්කි
    7. දිග්ගේ නැටුම
    8. සින්දු වන්නම්

05. දහ අට සන්නි පෙළපාලි වල නර්තනය සහ නාට්‍යමය ලක්ෂණ මතු කරලීම සඳහා වේෂ - භූෂණයෙන් ලැබී ඇති දායකත්වය විමසන්න.

06. පහතරට නර්තනයේ ප්‍රාසංගික ලක්ෂණ මතු කරලීමට භාවිතා කර ඇති ශිල්පීය ක්‍රමවේද පහත දැක්වෙන මාතෘකා යටතේ විග්‍රහ කරන්න.
1) නර්තනාංග සහ නාට්‍යමය පෙළපාළි
2) වේෂ - භූෂණ ක්‍රම

07. රිද්දි යාගයේ අන්තර්ගත නර්තනාංග හා නාට්‍යමය පෙළපාළි එම ශාන්තිකර්මයේ අරමුණු තහවුරු කිරීමෙහි ලා ඉවහල් වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

08. එක් නර්තන සම්ප්‍රදායක් තවත් සම්ප්‍රදායකින් වෙන් කර හඳුනාගත හැකි සුවිශේෂී ලක්ෂණ කවරේ දැ යි පහදන්න.

09. සබරගමු නර්තන සම්ප්‍රදායේ මඩු ශාන්ති කර්ම පිළිබඳ ව හඳුන්වා එහි අන්තර්ගත පෙළපාළි දෙකක සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

10. සබරගමු නර්තනයෙහි දී මාත්‍රා පහට හිමිවන ස්ථානය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

****************************